# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1813/12 – 2013 ජූනි 05 වැනි බදාදා – 2013.06.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 169 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/5/2012/එච්ඩබ්ලිව්/321.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බීඩී/එම්ජී/එල්එන්ඩී/2/1/10.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 මැයි මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, මීගහකිවුල.

2. **ඉඩමේ විස්තරය.**– ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මීගහකිවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඔයපළාත කෝරලේ සුළු කොට්ඨාසයේ මීගහකිවුල (22) ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ මීගහකිවුල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක B/ACQ/MGH/2013/296 හා 2013.04.25 දිනැති ප්‍රගමන අනුරේඛණයේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0039 ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – පීල්ලෙගෙදර වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0039

උතුරට: මාර්ගය (මා.සං.අ.) සහ දිසානායක මුදියන්සේලාගේ අජිත් බණ්ඩාර හිමිකම් කියන පීල්ලෙගෙදර වත්ත; නැගෙනහිරට: දිසානායක මුදියන්සේලාගේ අජිත් බණ්ඩාර හිමිකම් කියන පීල්ලෙගෙදර වත්ත සහ වෙලකොන වත්තේ වලව්වේ සේනානායක සෙනවිරත්න හේරත් මුදියන්සේලාගේ චන්ද්‍රාවතී කුමාරිහාමි හිමිකම් කියන පීල්ලෙගෙදර වත්ත; දකුණට: වෙලකොන වත්තේ වලව්වේ සේනානායක සෙනෙවිරත්න හේරත් මුදියන්සේලාගේ චන්ද්‍රාවති කුමාරිහාමි හිමිකම් කියන පීල්ලෙගෙදර වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ මාර්ගය (මා.සං.අ.).

06 – 444

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38(අ) අතුරු විධානය යටතේ ආඥාව

අංක 1796/15 හා 2013.02.07 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවේ පළ කරන ලද 2013 අංක 29 දරන ආඥාවේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා ප්‍රාදේශීය ලේකම්, තිඹිරිගස්යාය ලෙස සඳහන් වී ඇති අතර එය නාගරික කොමසාරිස්, කොළඹ ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: එල්/ඩී/05/2004/පීසී/159.
2013 මැයි මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 – 445